සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ව්‍යාපාර අධ්‍යයනය - I

13 ශ්‍රේණිය | **කාලය පැය 02 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01 - 31 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ලකුණු කරන්න.

(01) ව්‍යාපාරයක පදනමට අදාළ මූලිකාංග අනුපිළිවෙලින් දක්වා ඇති පිළිතුර කුමක්ද?

(1) ගනුදෙනුකරු / ලාභය / නිෂ්පාදිතය / අවශ්‍යතා වුවමනා
(2) ගනුදෙනුකරු / අවශ්‍යතා වුවමනා / නිෂ්පාදිතය / ලාභය
(3) ලාභය / නිෂ්පාදිතය / අවශ්‍යතා වුවමනා / ගනුදෙනුකරු
(4) නිෂ්පාදිතය / ලාභය / ගනුදෙනුකරු / අවශ්‍යතා වුවමනා
(5) අවශ්‍යතා වුවමනා/ ලාභය / ගනුදෙනුකරු / නිෂ්පාදිතය (........)

(02) විවිධ පාර්ශව ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට බලපාන හේතූන් කිහිපයක් පහත දැක්වේ.

A ලාභය B ව්‍යාපාරික වර්ධනය C වෙළඳපොළ කොටස
D ගත් තීරණවල සාර්ථකත්වය E වැටුප F රැකියාවේ ස්ථාවරභාවය
G උසස්වීම් H තනතුරේ සංවර්ධනය

ඉහත සඳහන් දෑ අතුරෙන් කළමනාකරුවන් පමණක් ව්‍යාපාර කෙරෙහි උනන්දුව දක්වන හේතූන් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A, B, D, H (2) A, C, D, H (3) A, D, E, H
(4) B, D, F, H (5) D, E, F, G (........)

(03) ව්‍යාපාරයක් සමාජ වගකීම් ඉටුකළ යුතු පාර්ශවය සඳහා ආදළ කාර්යයන් පිළිවෙලින් X හා Y ලෙස වගුවේ දැක්වේ.

X	Y
A සමාජය	1. සමානාත්මතාව
B ගනුදෙනුකරු	2. සාධාරණ ඉපයීම
C අයිතිකරුවන්	3. අපද්‍රව්‍ය කළමනාකරණය
D සේවකයින්	4. සාධාරණ මිල

X හා Y නිවැරදිව ගැලපූ විට නිවැරදි යුගල කාණ්ඩය කුමක්ද?

(1) A - 1 B - 2 C - 3 D - 4 (2) A - 4 B - 3 C - 2 D - 1
(3) A - 2 B - 3 C - 1 D - 4 (4) A - 3 B - 4 C - 2 D - 1
(5) A - 1 B - 2 C - 4 D - 3 (........)

(04) පහත දැක්වෙන්නේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරනු ලබන පාරිසරික බලවේග කිහිපයකි.

A ගනුදෙනුකරුවන් B සමාජ හා සංස්කෘතික සාධක C තරගකරුවන්
D සැපයුම්කරුවන් E ආදේශන භාණ්ඩ නිෂ්පාදකයින් F තාක්ෂණික සාධක

මේ අතුරෙන් ආසන්න පරිසර බලවේග පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A, B, C, D (2) A, C, D, E (3) A, C, D, F
(4) B, C, D, E (5) B, C, D, F (........)

(05) මුල්‍ය ප්‍රතිපත්තියට සහ පිස්කල් ප්‍රතිපත්තියට අදාළ අයිතම පහත දැක්වේ.

A පොලී අනුපාත B වර්තන වියදම් පාලනය

C බදු සහ දඩ මුදල් D විවිධ වෙළඳපළ කටයුතු

මේවායින් මුල්‍ය ප්‍රතිපත්තියට අදාළ අයිතම පිළිවෙලින් දක්වා ඇත්තේ,

(1) A, B සහ C, D තුළය. (2) A, C සහ B, D තුළය. (3) A, D සහ B, C තුළය.

(4) B, C සහ A, D තුළය. (5) B, D සහ A, C තුළය. (........)

(06) පහත වගුවේ X වලින් ප්‍රමිති සංකේත දැක්වෙන අතර, Y වලින් ප්‍රමිති නාම දැක්වේ.

X	Y
A ISO 9001 : 2008	1. ආහාර ආරක්ෂණ කළමනාකරණය
B ISO 14001 : 2004	2. තොරතුරු ආරක්ෂණ කළමනාකරණය
C ISO 22000 : 2005	3. වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිත කළමනාකරණය
D ISO 27000	4. පරිසර කළමනාකරණ පද්ධති
E OHSAS 18001 : 2007	5. තත්ත්ව කළමනාකරණ පද්ධති

ඉහත තොරතුරු නිවැරදිව ගලපා ඇති පිළිතුරු කුමක්ද ?

(1) A - 1 B - 2 C - 3 D - 4 E - 5 (2) A - 1 B - 3 C - 4 D - 5 E - 2

(3) A - 5 B - 4 C - 2 D - 1 E - 3 (4) A - 1 B - 2 C - 5 D - 4 E - 3

(5) A - 3 B - 1 C - 5 D - 4 E - 2 (........)

(07) ලාභ ඉපයීමේ අරමුණු වූ වගකීම් අසීමිත වූ නීතිමය පුද්ගලභාවයක් සහිත ව්‍යාපාර සංවිධාන අනුපිළිවෙලින් දක්වා ඇති නිවැරදි පිළිතුරු කාණ්ඩය,

(1) කේවල ස්වාමි / හවුල් ව්‍යාපාර / රාජ්‍ය සංස්ථා

(2) හවුල් ව්‍යාපාර / සීමිත සමාගම් / රාජ්‍ය සමාගම්

(3) හවුල් ව්‍යාපාර / රාජ්‍ය සංස්ථා / සීමිත සමාගම්

(4) රාජ්‍ය සංස්ථා / රාජ්‍ය සමාගම් / හවුල් ව්‍යාපාර

(5) රාජ්‍ය සංස්ථා / හවුල් ව්‍යාපාර / කේවල ස්වාමි (........)

(08) 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව කොටස් නිකුත් කිරීම සහ කොටස් මත වූ ඇරයුම් කිරීම සම්බන්ධයෙන් සමාගමට ලැබුණු හෝ ලැබිය යුතු හා ගෙවිය යුතු සියලුම මුදල් වල එකතුව,

(1) කොටස් ප්‍රාග්ධනය වේ. (2) නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය වේ.

(3) අවම සහභාග මුදල වේ. (4) ප්‍රකාශ කළ ප්‍රාග්ධනය වේ.

(5) ආරම්භක කොටස් ප්‍රාග්ධනය වේ. (........)

(09)

X	Y
A වරලත් ව්‍යාපාර	1. ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු තහනම්ය.
B රාජ්‍ය සමාගම්	2. ප්‍රාග්ධනයක් රහිතව ආරම්භ කළ හැකිය.
C ඇපයෙන් සීමිත සමාගම්	3. රජයේ පාලනය යටතේ පවතී.
D මිලකළ සමාගම්	4. කොටස් වෙළඳපොළේ ලියාපදිංචි කෙරෙයි.
E අක්වෙරළ සමාගම්	5. ව්‍යාපාර නාමය පුරස්කාරයට යටත් වේ.

ඉහත X හි ව්‍යාපාර සංවිධාන වර්ගද, Y හි ඒ හා සම්බන්ධ ප්‍රකාශ ද දැක්වේ. ඒ අනුව X හා Y නිවැරදිව ගැලපූ විට නිවැරදි යුගල කාණ්ඩය කුමක්ද?

(1) A - 5 B - 3 C - 4 D - 1 E - 2 (2) A - 5 B - 3 C - 2 D - 4 E - 1

(3) A - 5 B - 4 C - 3 D - 1 E - 2 (4) A - 1 B - 2 C - 5 D - 4 E - 3

(5) A - 1 B - 2 C - 3 D - 4 E - 5 (........)

(10) භාවිත කරන විදුලිබල ධාරිතාව කිලෝවොට් ඇම්පියර් 50 ට අඩු ව්‍යාපාර ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාර වර්ග කිරීමේ නිර්ණායකය ලෙස සලකන ආයතනය,

(1) කාර්මික සංවර්ධන මණ්ඩලය වේ.
(2) කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව වේ.
(3) ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව වේ.
(4) ශ්‍රී ලංකා මහ බැංකුව වේ.
(5) කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය වේ. (........)

(11) A තමන්ගේ හැකියාවන් උපරිම අන්දමට භාවිතා කිරීමට ඇති කැමැත්ත.
B සමාජයේ පවත්නා කිසියම් සමාජ ප්‍රශ්නයක් විසඳීම සඳහා දායක වීමට ඇති කැමැත්ත
C රැකියාවන්ගෙන් ලද අත්දැකීම්
D ස්ථාවර ආදායමක් ලබාගැනීමට ඇති කැමැත්ත
E යම් ක්ෂේත්‍රයක් පිළිබඳව ලබා ඇති අධ්‍යාපනය හා පුහුණුව
F අවදානම් අවම කර ගැනීමට ඇති කැමැත්ත

ඉහත දෑ අතුරෙන් ව්‍යවසායකයකු බිහිවීමට හේතු විය හැකි කරුණු ඇතුලත් සංයෝගය තෝරන්න.

(1) A, B, C, D (2) A, B, C, E (3) A, B, D, E
(4) B, C, E, F (5) C, D, E, F (........)

(12) පහත දැක්වෙන්නේ මුදලේ කාර්යයන් හා මුදලේ ගුණාංග කිහිපයකි.

A බෙදෙන සුළුබව B විනිමය මාධ්‍යයක් වීම.
C ආරක්ෂණ සංකේත D සමජාතීය බව
E වටිනාකමේ මිම්මක් වීම. F විලම්භිත ගෙවීම් මාධ්‍යයක් වීම

මින් මුදලේ ගුණාංග පමණක් ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) A, B, F (2) A, C, D (3) B, C, D
(4) B, E, F (5) C, D, E (........)

(13) පහත වගුවේ X හා Y තීරුවල චෙක්පත් ගනුදෙනු වලට අදාළ තොරතුරු කීපයක් දැක්වේ.

X	Y
A වර්ග	1. අණකරු, අණලද්දා, ආදායකයා
B සම්බන්ධවන පාර්ශවකරුවන්	2. සාමාන්‍ය, විශේෂ
C රේඛණය කිරීම	3. ධාරක, විධාන

(1) A - 1 B - 3 C - 2 (2) A - 3 B - 2 C - 1
(3) A - 2 B - 1 C - 3 (4) A - 3 B - 1 C - 2
(5) A - 1 B - 2 C - 3 (........)

(14) රක්ෂණය හා සම්බන්ධ මූලධර්ම පහත දැක්වේ.

A- රක්ෂ්‍ය හිමිකම B- උපරිම විශ්වාසය C- හානිපූරණය
D- දායකත්වය E- ආදේශනය F- ආසන්නතම හේතුව

ජීවිත රක්ෂණ සම්බන්ධයෙන් අදාළ වන මූලධර්ම පමණක් ඇතුළත් වන්නේ,

(1) A, B හා C වලය. (2) A, D හා C වලය. (3) A, B හා E වලය.
(4) A, B හා F වලය. (5) A, D හා E වලය. (........)

(15) පහත සඳහන් ආයතන අතුරෙන් ගිවිසුම්ගත ඉතිරි කිරීම් ආයතනයක් නොවන්නේ කුමක්ද?

(1) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල (2) සේවක අර්ථසාධක අරමුදල
(3) විශේෂිත කල්බදු සමාගම් (4) රක්ෂණ සමාගම්
(5) සේවක භාරකාර අරමුදල (........)

(16) භාණ්ඩ ප්‍රවාහනයේදී ව්‍යාපාරිකයකු ලෙස සලකා බලන ප්‍රධාන සාධක ඇතුලත් කාණ්ඩය තෝරන්න.

A පිරිවැය B සුවපහසුව C ධාරිතාව
D බලය E පර්යන්තය F ආරක්ෂාව

(1) A, B හා F (2) A, C හා E (3) A, C හා F
(4) A, D හා E (5) A, E හා F (........)

(17) කොළඹ වරායේ සිට සපුගස්කන්ද තෙල් පිරිපහදු මධ්‍යස්ථානය වෙත ඉන්ධන ප්‍රවාහනය කිරීමට වඩාත් සුදුසු පරිවහන මාධ්‍යයක් වන්නේ,

(1) ට්‍රක්රථ, උමංමාර්ග සහ දුම්රිය වේ. (2) නැව්, දුම්රිය සහ ට්‍රක්රථ වේ.
(3) දුම්රිය, නැව් සහ කුඩා අහස් යානා වේ. (4) නල මාර්ග, දුම්රිය සහ බවුසර් වේ.
(5) නල මාර්ග, බවුසර් සහ කුඩා අහස් යානා වේ. (........)

(18) විදේශ වෙළඳාමේ උන්නතියට එරෙහිව විවිධ සාධක බලපානු ලබයි. ඒ අතරෙන් නෛතික බාධාවක් ලෙස නොසලකන්නේ,

(1) විනිමය පාලනය ය. (2) රේගු නීතිරීතිය. (3) ආනයනය තහනම් කිරීමටය.
(4) භාෂාමය වෙනස්කම්ය. (5) තීරු ගාස්තුවය. (........)

(19) පහත සඳහන් කරුණු අතරින් ව්‍යාපාර ගෝලීයකරණය කිරීම සඳහා ප්‍රධාන සාධකය වන්නේ කුමක්ද?

(1) යුරෝපා සංගමය (2) තාක්ෂණය
(3) NAFTA වෙළඳ ගිවිසුම (4) රටවල්වල ජනවාර්ගික විවිධත්වය වැඩිවීම.
(5) වර්ධනය වූ දේශපාලන ස්ථාවරතාව (........)

(20) පහත වගුවේ X තීරුවේ කළමනාකරණ කාර්යයන්ද, Y තීරුවේ ඒ හා සම්බන්ධ කටයුතු ද දැක්වේ.

X		Y	
A	සැලසුම්කරණය	1.	විචල්‍යයන් හඳුනාගැනීම.
B	සංවිධානකරණය	2.	බලතල පැවරීම.
C	මෙහෙයවීම	3.	නායකත්වය
D	පාලනය	4.	උපාය මාර්ග සැකසීම

X හා Y යුගල ගත කළ විට නිවැරදි කාණ්ඩය කුමක්ද?

(1) A - 4 B - 2 C - 1 D - 3 (2) A - 1 B - 2 C - 3 D - 4
(3) A - 3 B - 2 C - 1 D - 4 (4) A - 4 B - 2 C - 3 D - 1
(5) A - 4 B - 3 C - 2 D - 1 (........)

(21) තීරණ ගැනීමේ බලතල පහළ මට්ටමේ තනතුරු දරන නිලධාරීන්ට පැවරීම සහ තීරණ ගැනීමේ බලතල ඉහළ කළමනාකාරීත්වය රඳවා ගැනීම පිළිවෙලින් හඳුන්වන්නේ,

(1) මධ්‍යගතකරණය හා විමධ්‍යගතකරණය යනුවෙනි.
(2) විමධ්‍යගතකරණය හා මධ්‍යගතකරණය යනුවෙනි.
(3) මධ්‍යගතකරණය හා දෙපාර්තුමේන්තුකරණය යනුවෙනි.
(4) දෙපාර්තමේන්තුකරණය හා මධ්‍යගතකරණය යනුවෙනි.
(5) පාලන අවකාශය හා මධ්‍යගතකරණය යනුවෙනි. (........)

(22) පහත සඳහන් පුද්ගලයින් අතරින් කළමනාකරණ කුසලතා හඳුන්වා දුන් පුද්ගලයා කවුරුන්ද?
(1) ඇඩම් ස්මිත් (2) හෙන්රි ෆෝර්ඩ් (3) හෙන්රි මින්ට්ස්බර්ග්
(4) රොබර්ට් එල්. කට්ස් (5) එෆ්. ඩබ්ලිව්. ටේලර් (........)

(23) ව්‍යාපාර සංවිධානයක සම්පත් නාස්තියකින් තොරව හා අවම පිරිවැයකින් පරිහරණය කිරීම හඳුන්වන්නේ,
(1) සඵලතාවය ලෙසය. (2) කාර්යක්ෂමතාව ලෙසය. (3) කාර්ය සාධනය ලෙසය.
(4) ඵලදායකත්වය ලෙසය. (5) තිරසාර සංවර්ධනය ලෙසය. (........)

(24) පරිගණක ආධාරක නිර්මාණකරණය (CAD) නිසා ඇති නොවන වාසිය කුමක්ද?
(1) අපතය අඩුවීම. (2) ශුන්‍ය දෝෂ නිෂ්පාදිත බිහිවීම.
(3) නිෂ්පාදනය වේගවත් වීම. (4) සේව්‍ය සේවක සබඳතා වර්ධනය වීම.
(5) ඵලදායිතාව වර්ධනය වීම (........)

(25) සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගත යුතු දෑ මොනවාදැයි විමසන ලද ප්‍රශ්නයට ශිෂ්‍යයින් කිහිපදෙනෙකු සැපයූ පිළිතුරු පහත පරිදි වේ.
A ප්‍රායෝගික බව B නම්‍යශීලී බව
C අවස්ථානුකූල සැලසුම් කිරීම D නිශ්චිත කාල පරාසයක් සඳහා වීම
E සම්පත් ලබාගත හැකි වීම.
ඉහත කරුණුවලින් සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගත යුතු දෑ වන්නේ,
(1) A පමණකි. (2) A හා B පමණකි.
(3) A, B හා C පමණකි. (4) A, B, C හා D පමණකි.
(5) ඉහත සඳහන් සියලුම කරුණුය. (........)

(26) සංවිධානකරණයට අයත් කාර්යයක් නොවනුයේ,
(1) වැඩ බෙදීම (2) බලතල පැවරීම. (3) සමායෝජනය
(4) සම්පත් බෙදාහැරීම (5) සන්නිවේදනය (........)

(27) ආර්ථික ඇණවුම් ප්‍රමාණය ගණනය කරනුයේ,
(1) රඳවා ගැනීමේ පිරිවැය හා මුළුතොග පිරිවැය අවම කර ගැනීමටය.
(2) මුළු තොග පිරිවැය අවම කිරීමට හා මුළු ඉල්ලුම සොයා ගැනීමටය.
(3) තොග මිල කිරීමට හා ඇණවුම් පිරිවැය අවම කර ගැනීමටය.
(4) තොග මිල කිරීමට හා ඇණවුම් ප්‍රමාණය අවම කර ගැනීටය.
(5) තොග රඳවා ගැනීමේ හා ඇණවුම් කිරීමේ පිරිවැය අවම කර ගැනීමටය. (........)

(28) නිෂ්පාදන ආයතනයක තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

වාර්ෂික ඉල්ලුම ඒකක සංඛ්‍යාව	20000
එක් ඇණවුමක පිරිවැය	රු.160
එක් ඒකකයක වාර්ෂික ගබඩා පිරිවැය	රු. 10

ආර්ථික ඇණවුම් ප්‍රමාණය වන්නේ, ඒකක
(1) 400 (2) 800 (3) 1000
(4) 1600 (5) 2000 (........)

(29) පහත සඳහන් තොරතුරු අතරින් මිළ කිරීමේ පරමාර්ථ පමණක් අඩංගු පිළිතුරු තෝරන්න.

A වෙළඳපොළ තුළ රැඳී සිටීම
B වෙළඳපොළ කොටස උපරිම කිරීම.
C පිරිවැය ඇස්තමේන්තු කිරීම.
D වර්තමාන ලාභ උපරිම කිරීම.
E භාණ්ඩ සඳහා ඉල්ලුම පුරෝකථනය කිරීම
F වෙළඳපොළ සාරය උරාගැනීම උපරිම කිරීම.

(1) A, B, C, D (2) A, B, D, F (3) A, C, D, E
(4) A, D, E, F (5) B, C, D, F (........)

(30) "ඉහළ ගුණාත්මක හා ක්‍රියාකාරීත්වයෙන් යුක්ත භාණ්ඩ වෙළඳපොළට සාධාරණ මිළකට සැපයුමෙන් පාරිභෝගිකයෝ ඊට පක්ෂපාති වනු ඇත." යන අදහස ඇතුළත් අලෙවිකරණ සංකල්පය වනුයේ,

(1) නිෂ්පාදන සංකල්පය (2) විකුණුම් සංකල්පය (3) නිෂ්පාදිත සංකල්පය
(4) ගනුදෙනුකරු සංකල්පය (5) අලෙවිකරණ සංකල්පය (........)

(31) පාරිභෝගික වෙළඳපොළ ඛණ්ඩනය කිරීම සඳහා අලෙවිකරුවන් යොදාගන්නා පාරිභෝගික ගති ලක්ෂණ පහත දැක්වේ.

A ස්ත්‍රී, පුරුෂ බව
B ආදායම
C පවුලක ප්‍රමාණය
D ජීවන රටාව
E පෞරුෂත්වය
F වෘත්තිය

මෙයින් ප්‍රජා විද්‍යාත්මක සාධක පමණක් නිවැරදිව ගලපා ඇති පිළිතුර වන්නේ,

(1) A, B, C, D (2) A, B, C, E (3) A, B, C, F
(4) A, C, D, E (5) B, C, D, E (........)

- **ප්‍රශ්න අංක 32 සිට 40 තෙක් වූ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**

(32) (අ) තරගකරුවන්, සැපයුම්කරුවන් .... පරිසර සාධක වන අතර, අයිතිකරුවන්, සේවකයන් .... පරිසර සාධකවලට අයත් වේ.

(ආ) ව්‍යාපාර ඉලක්ක වඩාත් පැහැදිලි කර ලිඛිතව ප්‍රකාශ කළ විට හඳුන්වන්නේ .... ලෙසය.

(33) (අ) පාරිභෝගික අයිතිවාසිකම් නීතියක් ලෙස ප්‍රකාශයට පත්කළ ජනාධිපතිවරයා .... වේ.

(ආ) 2013 මහ බැංකු වාර්තාවට අනුව මුළු රාජ්‍ය ආදායමින් වැඩි ප්‍රතිශතයක් ලැබී ඇති බදු වර්ගය වන්නේ, ... ය.

(34) (අ) ලාභය අනුව වෙනස්වන පොළියක් ලබන හවුල්කරු .... නමින් හැඳින්වේ.

(ආ) 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව වෘත්තීය හවුල් ව්‍යාපාරයක උපරිම හවුල්කරුවන් ගණන කොපමණද? ....

(35) (අ) ව්‍යවසායකයකුගේ ප්‍රධාන කාර්යය වන්නේ, ...

(ආ) කුඩා හා මහා පරිමාණ ව්‍යාපාර තීරණය කරන මිණුම් දඬු පොදුවේ ගත්කළ .... හා .... ලෙස වර්ග කළ හැකිය.

(36) (අ) මුදලක ප්‍රධාන ලක්ෂණය .... ලෙස දැක්විය හැකිය.

(ආ) බැංකු දෙකක ගිණුම් දෙකක් අතර හුවමාරු වන චෙක්පතකින් ගෙවීම් කළ හැකි උපරිම මුදල .... වේ.

(37) (අ) ශ්‍රී ලංකාවේ විශේෂිත මූල්‍ය ආයතන දෙකක් ලෙස .... සහ .... හැඳින්විය හැක.

(ආ) සිය ගනුදෙනුකරුවන්ගේ වටිනා භාණ්ඩ හා වැදගත් ලියකියවිලි ආරක්ෂා කර දීම සඳහා වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යනු ලබන සේවාව .... ලෙස හඳුන්වයි.

(38) (අ) .... සහ .... යනු සඵලදායී පණිවුඩයක් සකස් කිරීමේ දී සැලකිය යුතු සාධක දෙකකි.

(ආ) ආයතනයක මාසික ප්‍රගති සමාලෝචන රැස්වමේදී ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරි විසින් සෙසු කළමනාකරුවන් ඇමතීම .... මෙන්ම සන්නිවේදන ක්‍රමයකි.

(39) (අ) ව්‍යාපාර ගනුදෙනුවලදී විද්‍යුත් වෙළඳාම සිදුවිය හැකි ආකාර දෙකක් ලෙස .... සහ .... දැක්විය හැක.

(ආ) කිසියම් ප්‍රධානියකුගේ අධිකාරි බලය පැවරීම මත යම් කාර්යයක නිරත වන්නා හඳුන්වන්නේ .... ලෙසය.

(40) (අ) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ කොටස් දෙකක් ලෙස .... සහ .... හැඳින්විය හැක.

(ආ) භාණ්ඩයක් මිල කිරීමේ අරමුණු දෙකක් වන්නේ .... සහ .... ය.

The National e-learning Portal for The General Education

ප්‍රශ්න අංක 41 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.

(41) පාරිභෝගික අයිතිවාසිකම් 4 ක් ලියන්න.

(1) ....

(2) ....

(3) ....

(4) ....

(42) පිළිගත් සමූපකාර ප්‍රතිපත්ති 04 ක් ලියන්න.

(1) ....

(2) ....

(3) ....

(4) ....

(43) (අ) ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ ඇමරිකා එක්සත් ජනපදයේ (USA) ජාතික නිර්වචනය කුමක්ද?

....

....

(ආ) ජාත්‍යන්තර පාරිභෝගික දිනය කවදාද? ....

(44) අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් 4 ක් නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(4) ....

(45) (අ) කිසියම් නිෂ්පාදකයකු විසින් වෙළඳපොළට ඉදිරිපත් කරන භාණ්ඩයක අත්‍යවශ්‍යයෙන්ම ඇතුලත් විය යුතු අංග දෙකක් නම් කරන්න.

(1) .... (2) ....

(ආ) හෙන්රි මින්ස්බර්ග් ඉදිරිපත් කර ඇති අන්තර් පුද්ගල භූමිකා දෙකක් නම් කරන්න.

(1) .... (2) ....

(46) (අ) වෙළඳ ලකුණක් ලියාපදිංචි කළ යුතු පනත කුමක්ද? ....

(ආ) කාර්මික භාණ්ඩ බෙදා හැරීමේ මාර්ග දැක්වෙන පහත සටහනේ හිස්තැන්වලට සුදුසු පද යොදන්න.



(47) හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් පහත කාර්යයන්ට අදාළ නීති ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

(1) රු. 1000 කට වැඩි ප්‍රාග්ධනයක් යෙදීම. ....

(2) ලාභඅලාභ බෙදා ගැනීම. ....

(3) උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව ....

(4) ව්‍යාජ නමකින් පවත්වාගෙන යාම ....

(48) නිෂ්පාදන ව්‍යාපාරයක තොග සම්බන්ධ ගණනය කිරීමේදී අදාළ වන තොග මට්ටම් 4 ක් දක්වන්න.

(1) ....

(2) ....

(3) ....

(4) ....

(49) නව භාණ්ඩයක් වෙළඳපොළට හඳුන්වා කලක් ගත වූපසු එම භාණ්ඩයේ ජීවන චක්‍රය අදියර 5 ක් යටතේ අධ්‍යයනය කරයි. එයින් 4 ක් නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(4) ....

(50) අලෙවිකරණයේදී භාණ්ඩ හෝ සේවා වෙළඳපොළට හඳුන්වන්නේ ප්‍රචාරණය මගිනි. එහිදී අලෙවි කළමනාකරුවන් අනුගමනය කරන ප්‍රධාන ප්‍රචාරණ උපක්‍රම 4 නම් කරන්න.

(1) ....

(2) ....

(ල. 02 x 50 = 100)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

ව්‍යාපාර අධ්‍යයනය - II

13 ශ්‍රේණිය | **කාලය පැය 03 යි.**

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

I කොටස

01. "සවිසිරි" අර්ධ නාගරික විශාල භූමි ප්‍රදේශයක පිහිටි නවීන උපකරණ සහ කාර්යක්ෂම කාර්ය මණ්ඩලයකින් සමන්විත ජනප්‍රිය රෝහලකි.

(i) (අ) මෙම රෝහල සපයන සේවාවේ ස්වභාවය කුමක්ද?
(ආ) භාණ්ඩ හා සේවා අතර වෙනස්කම් මොනවාද?

(ii) (අ) ව්‍යාපාරයක ඉලක්ක (අරමුණු) හතරක් නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.
(ආ) වර්තමාන ව්‍යාපාර, ගනුදෙනුකරු කේන්ද්‍ර කරගෙන පවත්වාගෙන යයි. පැහැදිලි කරන්න.

(iii) පහත දැක්වෙන සංකල්ප යුගල අතර සමාන අසමානකම් විමසන්න.
(අ) වෙළඳපොළ ස්ථානය හා වෙළඳපොළ අවකාශය
(ආ) කල්පවතින භාණ්ඩ හා පහසු භාණ්ඩ

(iv) "ව්‍යාපාර විකාශනයේදී කාර්මික විප්ලවයෙන් සිදු වූ බලපෑම සුළුපටු නොවේ."
(අ) කාර්මික විප්ලවය, නිෂ්පාදනයට සහ වෙළඳාමට බලපෑම් කළ ආකාර වෙන වෙනම පහදන්න.
(ආ) විද්‍යුත් වාණිජ්‍ය තුළින් පාරිභෝගිකයන්ට සහ ව්‍යාපාරිකයන්ට ලැබෙන වාසි නම් කරන්න.

(v) (අ) ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇතැම් අංශවල ව්‍යාප්තියත් සමග සිදුවන ව්‍යාපාර ක්‍රියාකාරකම් මගින් සමාජයට හා ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවවලට අහිතකර බලපෑම් ඇතිවේ. එසේ අහිතකර බලපෑම් ඇති කරමින් ව්‍යාප්ත වන අංශ මොනවාදැයි කෙටියෙන් විස්තර කරන්න.
(ආ) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම ආයතනයකට වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ල. 20)

02. (i) පහත සඳහන් වන්නේ රජයක ආර්ථික අරමුණු ඉටු කර ගැනීමේදී යොදාගන්නා සංකල්ප කිහිපයකි. එමගින් අපේක්ෂිත දේ වෙන් වෙන්ව පැහැදිලි කරන්න.
(අ) ආර්ථික කාර්යක්ෂමතාව
(ආ) පූර්ණ සේවා නියුක්තිය
(ඉ) ආර්ථික වෘද්ධිය
(ඊ) ආර්ථික නිදහස

(ii) ශ්‍රී ලංකා රජය විසින් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී යොදාගන්නා උපකරණ හතරක් කෙටියෙන් විස්තර කරන්න.

(iii) (අ) පාරිභෝගික ජාත්‍යන්තරය ප්‍රකාශ කළ පාරිභෝගික අයිතිවාසිකම් සඳහන් කරන්න.
(ආ) ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධව ක්‍රියාකිරීමට රජය විසින් පනවා තිබෙන ප්‍රධාන නීතිය කුමක්ද?

(iv) (අ) වත්මන් සමාජය තුළ සමුපකාර සමිති එතරම් ප්‍රචලිත නොවන්නේ ඇයිදැයි විස්තර කරන්න.

(ආ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ අයිතීන් හතරක් සඳහන් කරන්න.

(v) (අ) රජයක් විසින් ව්‍යාපාර සඳහා බලපෑම් කළ හැකි ආකාර හතරක් සඳහන් කරන්න.

(ආ) අක්වෙරළ සමාගම් හා විදේශීය සමාගම් අතර ඇති සමානකම් හා අසමානකම් දෙක බැගින් සඳහන් කරන්න. (ල. 20)

03. (i) ශ්‍රී ලංකා ආර්ථික සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වයේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ කුඩා ව්‍යාපාරවලට පමණක් ආවේණික ලක්ෂණ පැහැදිලි කරන්න.

(iii) (අ) බැංකු මුදල් හා විද්‍යුත් මුදල් අතර ඇති වෙනස්කම් මොනවාදැයි උදාහරන සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ණයපත් භාවිතය තුළින් ව්‍යාපාරිකයන්ට හිමිවන වාසි හා අවාසි මොනවාද?

(iv) (අ) කල්බදු සමාගම්වලින් ව්‍යාපාරවලට ලැබෙන ප්‍රයෝජන මොනවාද?

(ආ) ව්‍යවසායකයින් සඳහා ව්‍යවසායක ප්‍රාග්ධන සමාගමක් විසින් සපයනු ලබන සේවා සඳහන් කරන්න.

(v) (අ) විදේශ වෙළඳාමේ උන්නතියට එරෙහිව බලපාන සාධක නම් කරන්න.

(ආ) විදේශ වළෙඳාමේ උන්නතිය සඳහා වන බාධා අවම කිරිමේ අරමුණින් පිහිටුවා ගෙන ඇති ජාත්‍යාන්තර සංවිධාන දෙකක් නම් කරන්න. (ල. 20)

04. (i) (අ) භාණ්ඩ ප්‍රවාහනයේ යෙදෙන නෞකාවක් ඉන්ධන කාන්දු වීම හේතුවෙන් නියමිත ගමන් මාර්ගය වෙනස් කර ගමන් කිරීමේදී අනතුරකට පත්ව ඇත. මෙහිදී රක්ෂණ වන්දි ලබාගත හැකිද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) සඵලදායි සන්නිවේදනය ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට ඉවහල් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ii) එළවලු හා පළතුරු ප්‍රවාහනය කිරීමේදී දුම්රිය හා මහාමාර්ග ප්‍රවාහනය යොදාගැනීම මගින් ඇතිවිය හැකි වාසි හා අවාසි සංසන්දනය කරන්න.

(iii) නිමාලී රිදී හා මැණික් ආභරණ නිපදවා අපනයනය කිරීමට අදහස් කරන අතර ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ඔබගෙන් අපේක්ෂා කෙරේ. එම භාණ්ඩ අපනයනය කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ මෑත කාලීන ප්‍රවනතාවක් ලෙස අධිවේගී මාර්ග සංකල්පය ව්‍යාප්ත වෙමින් ව්‍යාපාරික දෘෂ්ටි කෝණයෙන් අධිවේගී මාර්ග පිළිබඳ ඇගයීමක් කරන්න.

(v) (අ) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ තුළ සුපිරි වෙළඳසැල් සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබේ. සුපිරි වෙළඳසැල් වලින් පාරිභෝගිකයින්ට ලැබෙන වාසි හතරක් ලියන්න.

(ආ) පාරිභෝගිකයින් නවක ව්‍යාපාර ගනුදෙනු සඳහා විද්‍යුත් මාධ්‍ය යොදාගැනීමට පසුබට වන බවක් දක්නට ලැබේ. මෙම පසුබට වීමට හේතුවිය හැකි කරුණු හතරක් ලියන්න. (ල. 20)

II කොටස

05. (i) (අ) සංවිධානයක කාර්යක්ෂමතාව හා සඵලදායීතාවය මැනීමට යොදාගත හැකි නිර්ණායක මොනවාද?

(ආ) වර්තමානයේ දී කළමනාකරණය පෙරට වඩා වැදගත් වීමට හේතු විය හැකි කරුණු හතරක් ලියන්න.

(ii) (අ) කළමනාකරුගේ කාර්යයන් හෙන්රි මින්ස්බර්ග්ගේ වර්ගීකරණයට අනුව දක්වන්න.

(ආ) කළමනාකරුවකු ප්‍රගුණ කරගත යුතු සාමාන්‍ය කුසලතා වෙන වෙනම දක්වන්න.

(iii) (අ) සැලසුම්කරණයේ මූලධර්ම හතරක් දක්වන්න.

(ආ) දෙපාර්තමේන්තුකරණය කළ හැකි පදනම් හතරක් පැහැදිලි කරන්න.

(iv) පහත සඳහන් සංකල්ප යුගල අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

(අ) පවුල් සන්නම හා පුද්ගලික සන්නම

(ආ) කළමනාකරණ තොරතුරු පද්ධතිය හා අලෙවිකරණ තොරතුරු පද්ධතිය

(v) ප්‍රවර්ධන මිශ්‍රයේ උපාංග කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 20)

06. (i) (අ) ඉහළ කළමනාකරුවන් සඳහා වඩාත් වැදගත් වන කළමනාකරණ කුසලතාව කුමක්ද? හේතු දක්වන්න.

(ආ) ආයතන විසින් තම සේවක අභිප්‍රේරණය වූ සේවකයින්ගෙන් කළමනාකරණයට ලැබෙන ප්‍රතිලාභ මොනවාද?

(ii) (අ) ඵලදායිතාවය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ආ) ඵලදායිතාවය මැනීමට යොදාගන්නා සමීකරණය දක්වා එමගින් ලැබෙන පිළිතුරු ඇගයීමකට ලක්කරන ආකාරය ද පැහැදිලි කරන්න.

(iii) (අ) ආරක්ෂිත තොගය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ආ) ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ආයතන මුහුණ දෙන බාධක කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) නිෂ්පාදන ආයතනයක අවශ්‍ය ප්‍රමාණයට වඩා තොග පැවතීම නිසා මුහුණ පෑමට සිදුවන අවාසිදායක තත්ත්වයන් හතරක් පැහැදිලි කරන්න.

(v) නිෂ්පාදන පාලනයේ ක්ෂේත්‍ර 4 ක් නම් කරන්න. (ල. 20)

07. (i) පාසලක සාර්ථක කළමනාකාරීත්වයක් පවත්වාගෙන යාමට වඩා වැදගත් වන්නේ "ප්‍රජාතන්ත්‍රවාදී නායකත්ව ශෛලියද? නොඑසේ නම් ඒකාධිපති නායකත්ව ශෛලියද?"

(ii) (අ) සඵලදායී නායකයකුගේ ගතිලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(ආ) සේවක අභිමුඛ නායකත්වය යනු කුමක්දැයි නිර්වචනය කරන්න.

(iii) නව ව්‍යාපාරයක් ස්ථානගත කිරීමට යාමේ දී එම ප්‍රදේශයට දැරීමට වන සමාජ පිරිවැය හා සමාජ ප්‍රතිලාභ 2 බැගින් ලියන්න.

(iv) කළමනාකරණ කාර්යයන් අතරින් පාලන ක්‍රියාවලියට අයත් පියවරයන් අනුපිළිවෙලින් ලියන්න.

(v) කාණ්ඩ හා ප්‍රවාහන නිෂ්පාදනයේ ලක්ෂණ දෙක බැගින් වෙන් වෙන්ව දක්වන්න. (ල. 20)

08. (i) පහත දැක්වෙන තොරතුරු පද්ධති හඳුන්වා ව්‍යාපාර ආයතනයක් තුළ ඒවා පරිශීලනය කරන පුද්ගලයන් නම් කරන්න.

(අ) ගනුදෙනු සැලසුම් පද්ධති (TPS)

(ආ) විධායක උපකාරක පද්ධති (ESS)

(ii) නූතන තාක්ෂණය භාවිතයෙන් ව්‍යාපාර ආයතනයකට ලැබිය හැකි ප්‍රතිලාභ පැහැදිලි කරන්න.

(iii) ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය වන්නේ නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී පමණක් නොවේ. පැහැදිලි කරන්න.

(iv) පහත සඳහන් දෑ පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(අ) ලෝක ව්‍යාප්ත වෙබ් (www) (ආ) බාහිර ජාලය (Extranet)

(v) ව්‍යාපාර සැලැස්මක් සකස් කර ගැනීමට සහාය ලබාගතහැකි ආයතන 4 ක් නම් කරන්න. (ල. 20)

The National e-Learning Portal for The General Education